# 2024 අප්‍රේල් මස වන 30 දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු වාර්තාව

පැමිණීම :- පැමිණීමේ ලේඛනයේ සඳහන් පරිදි වේ.

2024 අප්‍රේල් මස 30 වන දින පෙ.ව.09.00ට දිස්ත්‍රික් ලේකම් එච්.පී.සුමණසේකර මහතාගේ ප්‍රධානත්වයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේදී රැස්වීම ආරම්භ කළ අතර , එතුමා විසින් පැමිණ සිටි සියලු දෙනා පිළිගන්නා ලදි.

**02. පසුගිය වාර්තාව සමාලෝචනය**

| අනු අංකය | විෂය ක්ෂේත්‍රය | කාරණය | තීරණ /ප්‍රගතිය | වගකීම |
|---|---|---|---|---|
| 03. | 3.1පොහොර බෙදාහැරීමේ වැඩසටහන 2024 යල කන්නය | පොහොර ලැබීම හා නිකුත් කිරීම් | 2024 යල කන්නයේ පොහොර සඳහා මුදල් ලබා දීම සිදුවන බවත්, හෙක්ටයාරයක් සඳහා රු.15,000.00ක මුදලක් උපරිම හෙක්ටයාර 2ක් සඳහා ලබා දීමේ කටයුතු ගොවිජන සේවා දෙපාර්තමේන්තුවේ මූලිකත්වයෙන් සිදුකරන බව සඳහන් කරන ලදි.<br>අවශ්‍ය පොහොර ප්‍රමාණය රජයේ සමාගම් දෙකකින් සහ පෞද්ගලික සමාගම් 13ක් මගින් ලබා දීමට එකඟවී ඇත.<br>ඉලක්කය හෙක්. 36773.8කි. 2024 යල කන්නය සඳහා පොහොර ලබා දීමේ ගැටලුවක් හෝ හිඟයක් නොමැත.<br>කිරිදිඔය කලාපයේ කුඹුරු සඳහා මේ වනවිට පොහොර අවශ්‍යව ඇති බැවින් ගොවීන් වෙත අදාළ මුදල් ලබා දීම කඩිනම් කිරීමට කටයුතු කරන ලෙස ගොවි නියෝජිතයින් විසින් ඉල්ලීම් කරන ලදී.<br>එම්.ඕ.පී පොහොර මිල පෞද්ගලික අංශයේ මිල රු11,000.00ක් පමණ වන අතර ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් පොහොර කිලෝග්‍රෑම් 50ක මිටියක් රු.9,000.00ක මුදලකට මිලදී ගැනීමට හැකි බව දැනුම් දෙන ලදී.<br>ගොවීන් සඳහා පොහොර වෙනුවෙන් මුදල් ලබා දීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ගොවීන් 474 දෙනෙකුගෙන් බැංකු ගිණුම් ප්‍රතික්ෂේප වී ඇති බැවින් එම කටයුතු මේ වන විට නිවැරදි කිරීම් සිදුකරමින් පවතින බව දැනුම් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ පොහොර |
| | 3.2 රජයේ පොහොර සමාගම් වල කටයුතු | ලංකා පොහොර සමාගම | 2024 යල කන්නය සඳහා යූරියා මෙ.ටො 900ක් දිස්ත්‍රික්කය සඳහා වෙන් කර ඇත. එම්.ඕ.පී.අවශ්‍ය පරිදි ඉල්ලුම් කළ හැක. නමුත් මේ වනතෙක් කිසිදු ගොවිජන සේවා මධ්‍යස්ථානයක් මගින් ඉල්ලුම් කර නොමැත. | දිස්ත්‍රික් අලෙවි නිලධාරී ලංකා පොහොර සමාගම |
| | | කොමර්ෂල් පොහොර සමාගම | සමාගම සතුව දැනට ටී.එස්.පී. පොහොර නොමැති බැවින් එස්.එස්.පී. ලබාදීමේ වැඩපිළිවෙළක් සකස් කර ඇති බවත්, ගොවීන් සඳහා අවශ්‍ය එස්.එස්.පී ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා මෙන්ම පෞද්ගලික අලෙවි නියෝජිතවරු මගින් කිලෝග්‍රෑම් 20 හා 50 මිටි මිල දී ගත හැකි බව සඳහන් කරන ලදි.<br>ගොවිජනසේවා මධ්‍යස්ථාන වෙත පොහොර සඳහා ඉල්ලීම් කරනු ලබන වට්ටම සම්බන්ධව ලිඛිතව කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත දැනුම් දෙන ලෙස අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් අලෙවි නිලධාරී කොමර්ෂල් පොහොර සමාගම |
| 04. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂගේ දකුණු කොරියානු නිළ සංචාරය පිළිබඳ ඉදිරිපත් කිරීම (2023.10.22 - 2023.11.04) | | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලද අවස්ථාවකට අනුව දකුණු කොරියානු නිළ සංචාරය සඳහා ශ්‍රී ලංකාව නියෝජනය කරමින් හම්බන්තොට දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ සහභාගි විය. දකුණු ආසියාතික රටවල් 13ක් නියෝජනය කරමින් නියෝජිතයින් 13 දෙනෙකු සහභාගි විය. එහිදී ලබා ගත් අත්දැකීම් හා දැනුම පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලදි.<br>1.)දකුණු කොරියාවේ රාජ්‍ය ආයතනයක් ලෙස කොරියානු බීජ සහ විවිධ සේවා (KSVS) හි පසුබිම, මෙහෙවර, දැක්ම සහ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් KSVS හඳුන්වාදීම | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ |

| | | | | |
|---|---|---|---|---|
| | | | පිළිබඳ තොරතුරු<br><br>2) අධ්‍යයන මධ්‍යස්ථාන, පුහුණු මධ්‍යස්ථාන, බීජ එකතු කිරීම, අභිජනනය, තවාන් කර්මාන්තය, PVP කළමනාකරණය සහ බීජ වෙළඳපල වැනි බීජ කර්මාන්තයේ දකුණු කොරියානු ප්‍රතිපත්තියට අදාළ කොරියාවේ බීජ කර්මාන්තය පෝෂණය කිරීම පිළිබඳ ප්‍රතිපත්තිය හා සම්බන්ධ තොරතුරු<br><br>3.)කොරියාවේ බීජ බෙදාහැරීමේ කළමනාකරණය ලියාපදිංචිය, බීජ කළමනාකරණය, ශාක හා බීජ පහසුකම්වල ලක්ෂණ, සම්බන්ධ ලේඛන, වාර්තා කිරීම, බීජ ගුණාත්මකභාවය සහ පරීක්ෂා කිරීම වැනි බීජ බෙදා හැරීමේ කළමනාකරණය පිළිබඳ තොරතුරු<br><br>4) ජාතික සහතික ලත් බීජ නිෂ්පාදනය සහ සැපයුම් පද්ධතිය ලියාපදිංචි බීජ නිෂ්පාදනය, පරීක්ෂා කිරීම, සැපයීම සහ පසු සැකසීම පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලදි.<br><br>දකුණු කොරියානු නිළ සංචාරය සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත අවස්ථාව ලබා දුන් දිස්ත්‍රික් ලේකම් වෙත ස්තූතිය පළ කර සිටින බව සඳහන් කරන ලදි. | |
| 05. | කෘෂිකර්ම නවීකරණ වැඩසටහන | ප්‍රගතිය | හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස දෙකක් එනම් සූරියවැව හා අඟුණුකොළපැලැස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තෝරාගෙන ඇති අතර මෙය නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන බව දැනුම් දෙන ලදී. එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් වෙත මිලියන 25ක් ලැබෙන අතර ග්‍රාමීයව ඇතිකරගන්නා කමිටු මගින් සුදුසු ව්‍යාපෘති වාර්තා සකසා ගොවි සමාගම් ගොඩ නගා ගොවීන් වෙත ලබා දෙන ප්‍රතිපාදන නැවත අයකර ගැනීමේ පදනම මත ගොවීන් වෙත ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නියමිත බව ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්න ලද රැස්වීමක් මගින් දැනුම් දෙන ලදී. මෙම මුදල් ගොවි සමාගමට අයකර ගැනීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී.<br>මෙම දිස්ත්‍රික් කෘෂිකර්ම නවීකරණ මණ්ඩලයේ සභාපති ලෙස දිස්ත්‍රික් ලේකම් හා කැඳවුම්කරු ලෙස දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ ඇතුලුව කමිටුවේ අනෙකුත් සාමාජිකයින් දැනුම් දෙන ලදී.<br>ග්‍රාමිය මට්ටමට සමාගමක් සකස් කිරිම ප්‍රායෝගිකව සුදුසු නොවන බවත්, සමිතියක් සකස් කිරිම සුදුසු බවත් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ |
| 06. | තරුණ කෘෂි ව්‍යාවසායකත්ව ගම්මාන පිහිටුවීම | ව්‍යාපෘති වාර්තා සැකසීම | 2023 වර්ෂයේ තරුණ කෘෂි ව්‍යාවසායකත්ව ගම්මාන වැඩසටහන ගම්මාන 7ක් තුල සිදු කරන ලදි. එම ව්‍යාපෘති වල ප්‍රගතිය ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ලබා දිමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී.<br><br>2024 වසරේද එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක් සඳහා තවත් අමතර ගම්මාන 2ක් තුල, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇති බව දැනුම් දෙන ලදී. මෙම ගම්මාන සඳහා ව්‍යාපාති වාර්තා යොමු කරන ලෙස දැනුම් දී තිබුනද යම් යම් ප්‍රාදේශීය ලේකම් කාර්යාල මගින් වාර්තා එවා නොතිබූ අතර යොමු කරන ලද ව්‍යාපෘති වාර්තා කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත යොමු කර ඇත. මේ වනවිට අන්නාසි වගාව සඳහා රු.මි.7.75ක් ද, වැල් දොඩම් වගාව සඳහා රු.මි.5.7ක් ද, පැපොල් වගා ව්‍යාපාතියට රු.මි.8.8ක් ද, බිම්මල් වගා ව්‍යාපෘතියට රු.මි.10.25ක් ද වෙන් වී ඇත. බිම්මල් වගා ව්‍යාපෘතියට | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වලස්මුල්ල ඕමාර බටහිර හා නැගෙනහිර ප්‍රතිලාභීන් 8කි, ඕකෙවෙල කණුමුල්දෙණිය උතුර හා නැගෙනහිර කඩිගමුව ප්‍රතිලාභීන් 20කි. අන්නාසි වගාව ව්‍යාපෘතියට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 35කි. අනුමත කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය රු.මි. 7.75075කි. වැල් දොඩම් ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4කි. ප්‍රතිලාභීන් 20කි. පැපොල් වගා ව්‍යාපෘතිය සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක ප්‍රතිලාභීන් 30කි. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ, හම්බන්තොට. |
| | | මුං වගා ව්‍යාපෘතිය | දිස්ත්‍රික්කය තුළ අඩු ආදායම්ලාභී ගොවි පවුල් සඳහා වගා කිරිමට මිලියන 25ක මුංඇට කිලෝග්‍රෑම් 17898කට ආසන්න ප්‍රමාණයක් ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා බෙදාදීමට කටයුතු කළ බව දැනුම් දෙන ලදි. මුං බීජ වගා කිරීමේ ප්‍රගතිය දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත කඩිනමින් වාර්තා කරන ලෙස දැනුවත් කරන ලදි. | |
| 07. | SAPP (කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර ව්‍යවසායකත්ව) ව්‍යාපෘතියේ ප්‍රගතිය | | ඉතිරි බඩඉරිඟු බීජ මේ වනවිට ගබඩා කර ඇති අතර ජීව්‍යතාවය පිළිබඳ ගැටලු පැවතිය හැකි බවත්, දැනට ඉතිරිව පවතින බීජ ප්‍රමාණයන් පිළිබඳව වාර්තාවක් ගොවිජන සේවා මධ්‍යස්ථාන මගින් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ වෙත ලබා දිමට කටයුතු කරන මෙන් තීරණය විය. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ හම්බන්තොට |
| 08. | 8.1. අන්තර් පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත | |
| | 8.2. පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තුව (2024 යල කන්නය) | මුං වගාව | ඉලක්කය හෙක්ටයාර 627කි. | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (පළාත්) |
| | | අතිරේක බෝග වගාව | ඉලක්කය හෙක්ටයාර 1300ක් පමණ වේ. | |
| | | ලූණු වගාව | සූරියවැව, අඟුනුකොළපැලැස්ස හා තිස්සමහාරාමය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ රතුලූනු හා ලොකු ලූණු අක්කර 25ක් වගා කිරිමට බීජ නිකුත් කර ඇති අතර මේ මස අවසානයේදි ක්ෂේත්‍ර [illegible] සංස්ථාපන කටයුතු සිදු කිරිමට නියමිත බව සඳහන් කරන ලදි. | |
| | | වි වගාව | වැඩිඅස්වනු යාය ව්‍යාපෘතිය සම්පූර්ණ අක්කර 150ක සිදු කිරිමට නියමිත අතර අන්තර්පළාත් බල ප්‍රෙද්ශය තුළ අක්කර 65ක් හා අක්කර 85ක් පළාත් බල ප්‍රෙද්ශය තුළ සිදු කිරිමට නියමිත බව සඳහන් කරන ලදි. ගැඹුරට බිම් සකස් කිරිම සඳහා රුපියල් 10,000ක මුදලක් හා දහයියා අඟුරු කිලෝග්‍රෑම් 250ක් යෙදිම සඳහා රුපියල් 2000ක මුදලක් ලබා දිමට නියමිත බව සඳහන් කරන ලදි.<br><br>AT 378 සුදු වී වගා කිරිමට නියමිත බව සඳහන් කරන ලදි. | |
| | 8.3 මහවැලි අධිකාරිය | වී වගාව (2024 යල කන්නය) | ඉලක්කය හෙක්ටයාර 7070කි. මේ වනවිට හෙක්ටයාර 8123.4ක් වගා කර ඇත. | නියෝජ්‍ය නේවාසික ව්‍යාපාර කළමණාකරු, ශ්‍රිලංකා මහවැලි අධිකාරිය, ඇඹිලිපිටිය. |
| | | අතිරේක ක්ෂේත්‍ර බෝග | ඉලක්කය හෙක් 1388කි. හෙකටයාර 94ක් ස්ථාපනය කර ඇත. | |
| | | එළවළු වගාව | ඉලක්කය හෙක් 315කි. හෙක්ටයාර 61ක් ස්ථාපනය කර ඇත. | |
| | | පළතුරු වගාව | ඉලක්කය හෙක් 6022කි. හෙක්ටයාර 5088.3ක් ස්ථාපනය කර ඇත. | |

| | | | | |
|---|---|---|---|---|
| | | | 2024 යල කන්නය මාර්තු 20වන දින ආරම්භ කළ බවත්, ජලය නිකුත් කිරීම අප්‍රේල් 11 වන දින සිදු කළ බවත් සඳහන් කරන ලදි. උඩවලව ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 195891කි. | |
| | 8.4. බීජ හා රෝපණ ද්‍රව්‍ය | ප්‍රගතිය | 2024 යල කන්නය සඳහා මූලික බීජ වී නිකුත් කිරීමේ කටයුතු මේ වනවිට සිදුකරමින් පවතී. නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ(ව්‍යාප්ති) හම්බන්තොට සඳහා නිකුත් කර ඇති බිත්තර වී නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 41කි. වගා වපසරිය අක්කර 15.5කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 1550කි.<br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (අ.ප.වා) සඳහා නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 209කි. වගා වපසරිය අක්කර 73කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 7300කි. ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සඳහා නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 61කි. වගා වපසරිය අක්කර 21කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 2100කි. වලව බීජ සංගමය හුංගම සඳහා නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 4කි. වගා වපසරිය අක්කර 2කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 200කි. ශ්‍රී ශක්ති ගොවි සංවිධානය නිකුත් කර ඇති ප්‍රමාණය බුසල් 12කි. වගා වපසරිය අක්කර 4කි. අපේක්ෂිත ඉලක්කය බුසල් 400කි. මීට අමතරව සාමාන්‍ය ව්‍යාප්තිය සඳහා බීජ වී බුසල් 1176ක ප්‍රමාණයක් නිකුත් කර ඇත. ස්වයං බීජ වී නිෂ්පාදන ව්‍යාපෘතිය සඳහා කිලෝග්‍රෑම් 2 ලියාපදිංචි බීජ වී පැකට් 300ක් නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ අන්තර් පළාත් හම්බන්තොට සඳහා නිකුත් කර ඇත. 2024 අප්‍රේල් 29 වන දිනට මාස අවසානයේ තොග තත්ත්වය අතිරේක ආහාර බෝග බීජ මුං එම් අයි.6 ලියාපදිංචි පංතිය කි.ග්‍රෑ 200කි. කවුපි දවල සහතික පංතිය කිලෝග්‍රෑම් 12කි. කව්පි වරුණි සහතික පංතිය කිලෝග්‍රෑම් 5102කි. කව්පි ඒ.එන්.කේ.සී.පී 01 සහතික පංතිය කිලෝග්‍රෑම් 487කි. කව්පි ඒ.එන්.කේ.සී.පී.02 සහතික පංතිය කිලෝග්‍රෑම් 1055.5කි. බඩඉරිඟු භද්‍රා ලියාපදිංචි පංතිය කිලෝග්‍රෑම් 10කි. බඩඉරිඟු දෙමුහුන් කිලෝග්‍රෑම් 02කි. රටකජු තිස්ස සහතික පංතිය කිලෝග්‍රෑම් 400කි. වාණිජ පංතිය කිලෝග්‍රෑම් 400කි. රටකජු ඒ.එන්.කේ 02 සහතික පංතිය කිලෝග්‍රෑම් 10කි. තල උමා ලියාපදිංචි පංතිය කිලෝග්‍රෑම් 10කි. වාණිජ පංතිය කිලෝග්‍රෑම් 1.5කි. කුරක්කන් ඕෂධ සහතික පංතිය කිලෝග්‍රෑම් 120කි. උඳු එම්.අයි 01 සහතික පංතිය කිලෝග්‍රෑම් 200කි.<br>2024 අප්‍රේල් 29 වන දිනට බීජ වී තොග තත්ත්වය ඒ.ටී. 313 ලියාපදිංචි පංතිය බුසල් 131කි. සහතික පංතිය බුසල් 123කි. ඒටී.362 අත්තිවාරම් පංතිය බුසල් 216කි. ලියාපදිංචි පංතිය බුසල් 2000කි. එල්.ඩී.368 ලියාපදිංචි පංතිය බුසල් 272කි. බී.ජී. 352 අත්තිවාරම් පංතිය බුසල් 09කි. ලියාපදිංචි පංතිය බුසල් 40කි.<br>මේ වනවිට බීජ මිලදී ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර ඊළඟ කන්නය සඳහා අවශ්‍ය මුං බීජ ගොවි ජනතාව විසින්ම නිෂ්පාදනය කරගැනීමට කටයුතු කරන මෙන් දැනුම් දෙන ලදි.<br>ස්වාභාවික හේතූන් නිසා වී වගා කිරීමට ප්‍රමාද වන ගොවි ජනතාව මාස 2 ½ හෝ මාස 3 වී වගා කිරීමට දැනුවත් කළ යුතු බවත්, රාජ්‍ය මැදිහත් වීමක් සහිතව නිසි වැඩපිළිවෙළක් සකස් කරන මෙන් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි. දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු යෝජනාවක් ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කිරීමට ලිපියක් සකස් කරන මෙන් දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදි.<br>අවශ්‍යතායක් වෙනුවෙන් භාවිතා කිරීම සඳහා මාස 2 ½ හෝ මාස 3 බිත්තර වී ස්වාරක්ෂක තොගයක් (Buffer Stock) පවත්වා ගෙනයාම වඩාත් සුදුසු බව දිස්ත්‍රික් | නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), බටඅත.<br><br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), බටඅත.<br><br>නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ (බීජ), බටඅත.<br><br>නියෝජ්‍ය කෘෂිකර්ම |

| | | | | |
|---|---|---|---|---|
| | | | කෘෂිකර්ම අධ්‍යක්ෂ විසින් දැනුම් දෙන ලදී. කුඹුරු අක්කර 30ක පමණ මාස 3 වී වගා කිරිමට හැකි බවත්, සහතික බීජ මිලදී ගැනීමට හැකියාවක් පවතින අතර ඒ සඳහා ගොවීන් සම්බන්ධ කර දෙන මෙන් දැනුවත් කරන ලදී. | අධ්‍යක්ෂ (බීජ), බටඅත. |
| 09. | සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු වේ වැඩසටහන් | | විශේෂ ගැටලු කිසිවක් වාර්තා නොවීය. | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ හම්බන්තොට. |
| 10. | ඒකාබද්ධ ජල ධාරා හා ජල සම්පත් කළමණාකරණ ව්‍යාපෘතිය (IWWRMP) | ඒකාබද්ධ ජලධාරා කළමණාකරන ව්‍යාපෘතිය කාලගුණික බලපෑම් අවම කිරිමේ බහුඅදියර ප්‍රෙවිශය ව්‍යාපෘතිය | ව්‍යාපෘති 25න් 22ක වැඩ කටයුතු මේ වනවිට අවසන්ව ඇත. ව්‍යාපෘති 03ක වැඩ මේ වනවිට සිදු කරමින් පවතින බව දැනුම් දෙන ලදී.<br><br>පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව, ගොවිජන සේවා දෙපාර්තමේන්තුව සහ වාරිමාර්ග දෙපාර්තමේන්තුව ව්‍යාපෘති 49කින් ව්‍යාපෘති 13ක වැඩ අවසන් කර ඇත. 17ක් ටෙන්ඩර් කර ඇත. මිලියන 400කට අධික ඇස්තමේන්තු සකසා ප්‍රධාන කාර්යාලය වෙත යොමුකර ඇති බව දැනුම් දෙන ලදී | දිස්ත්‍රික් වාරිමාර්ග අධ්‍යක්ෂ, හම්බන්තොට. |
| 11. | දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතියේ වැඩසටහන් | ප්‍රගතිය ඉදිරිපත් කිරිම | දිස්ත්‍රික්කයේ වැව් 74ක් ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කරන ලද අතර වැව් 54ක වැඩ අවසන් කොට ඇත. වැව් 18ක වැඩ කටයුතු සිදු කරමින් පවතී. මෙම වැව් 18න් 14ක වැඩකටයුතු ජූනි මස වන විට අවසන් කිරීමට හැකි වනු ඇත. වර්ෂාව හේතුවෙන් වැව් 4ක වැඩ කටයුතු ප්‍රමාද වූ බව දැනුම් දෙන ලදී.<br>තවත් වැව් 12ක්, ඇනිකට් එකක් සහ උස්සාන වාරිමාර්ග ක්‍රම 4ක ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කිරිම සඳහා අනුමත වී ඇති බව දැනුම් දෙන ලදී. 2025 අවසන් කාලය දක්වා ව්‍යාපෘතියේ කාලය දිගු කිරිම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව දැනුම් දෙන ලදී. පවතින වගා ළිං 20ක් ප්‍රතිසංස්කරණය සඳහා මුදල් ලැබී ඇති අතර වගා ළිං හිමි ගොවි මහත්වරුන් සම්බන්ධ කරන්නේ නම් අදාළ ප්‍රතිසංස්කරණ කටයුතු සිදු කළ හැකි වනු ඇති බව දැනුම් දෙන ලදී.<br><br>වන සංරක්ෂන කලාපය තුල අලුතින් ඉදිකරන ලද වැව් ආශ්‍රිතව රුක්රෝපණ කටයුතු නිසි ආකාරව සිදු නොවීම හේතුවෙන් එම කටයුතු අවසන් වන තෙක් නව ප්‍රතිසංස්කරන සඳහා අවසර ලබා නොදෙන ලෙස ප්‍රධාන කාර්යාලයෙන් දැනුම් දී ඇති බව වන දිසා වන නිලධාරී විසින් දැනුම් දෙන ලදී.<br>ක්‍රියාත්මක වන්නාවූ සියලු ව්‍යාපාතිවල කටයුතු රජයේ ආයතන වෙත ලබා දී රජයේ නිළධාරීන් මගින් හා එම සම්පත් උපයෝගී කරගනිමින් කටයුතු කිරීමෙන් ව්‍යාපෘති වල ඵලදායීතාවය වැඩි වනු ඇති බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, දේශගුණික සුහුරු වැඩසටහන |
| 12. | වැලිගත්ත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනයේ වැඩසටහන් | ප්‍රගතිය | නව අධ්‍යාන වර්ෂය සඳහා සිසුන් ඇතුලත් කර ගත් බවත්, අධ්‍යාන කටයුතු ආරම්භ කර බවත් දැනුම් දෙන ලදී. | අධ්‍යක්ෂ, වැලිගත්ත කෘෂි තාක්ෂණික හා ග්‍රාමීය විද්‍යායතනය |
| **13.** | මහා වාරිමාර්ග 13.1.1 මුරුතවෙල ජලාශය | වර්තමාන ජල ධාරිතාවය | මුරුතවෙල ජලාශයේ ජල ධාරිතාවය මේ වනවිට අක්කර අඩි 34350 (88%)කි. උඩුකිරිවිල ජලාශයේ වර්තමාන ජල ධාරිතාවය අක්කර අඩි 2753කි. (90%) කි. මුරුතවෙල යාය 1,2 100%ක් වගාකොට අවසන් ව ඇති අතර යාය 3 80%ක් බෝග සංස්ථාපන කටයුතු අවසන්ව ඇත. උඩවලව ජලාශය පිටාර මට්මේ පවතින බැවින් යාය 3 කලාපයට මහවැලි ජලය වැඩි ප්‍රමාණයක් ලබා දෙන ලෙස ඉල්ලීම් කරන ලදී. මැයි 20 දිනය කලින් වපුරා අවසන් කළ යුතු ව ඇත. කැකිරිඔබඩ අක්කර අඩි 2227කි එනම් (96%) වේ. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු (වීරකැටිය) |

| | | | | |
|---|---|---|---|---|
| | 13.1.2. කිරම ඔය | | කිරම වැව වර්ථමාන ජල ධාරිතාවය අක්කර අඩි 675කි. කිරම ඔය ව්‍යාපාරයේ අක්කර 5000ක් පමණ වගා කටයුතු සිදුකරනු ලබන අතර අප්‍රේල් 15 ජලය නිකුත් කර ඇත. පිං ඔඩයේ පහල කොටස ගංවතුරට අසුවූ බැවින් මැයි මස 20ට කලින් වපුරා අවසන් කිරිමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු (වීරකැටිය) |
| | 13.1.3. ඌරුබොකුඔය | | කොටසක වී වගා කටයුතු වල ගැටලුවක් ඇති නොවූ බවත්,එක් කොටසක ගංවතුර හේතුවෙන් වගා කටයුතු ප්‍රමාදවූ අතර සමස්ථයක් ලෙස අප්‍රේල් මස 20 වන දින වගා කටයුතු සඳහා ජලය ලබා දුන් බව දැනුම් දෙන ලදී. තංගල්ල වෙල්යායේ පුරන්වී ඇති කුඹුරක් උපයෝගී කරගනිමින් සෝජාන් වගාවක් සිදුකිරිම සඳහා අවශ්‍ය අනුමැතිය මාර්තු 21 වන දින එස්.එල්.ආර්.ඩී.සී මගින් ගොවිජන සේවා දෙපාර්තමේන්තුව වෙත ලබා දී ඇති අතර ඉඩම් හිමිකරු රු.123,000.00ක මුදලක්ද එම අනුමැතිය ලබා ගැනීම සඳහා ගෙවා ඇති අතර ඔහුට අවශ්‍ය සහාය ලබා දිය හැකි බව දැනුම් දෙනලදී. මේ සඳහා ප්‍රෙද්ශයේ ගව හිමියන්ගේ විරෝධයක් පවතින බවත් දැනුම් දෙන ලදී. රන්න ආශ්‍රිතව ඌරුබොකු ඔයට රාජ්‍ය දැව සංස්ථාව තංගල්ල ප්‍රාදේශීය ලේකම් මගින් දැනුවත් කිරිම් කළද මේ වනතෙක් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොමැති බව දැනුම් දෙන ලදී. | |
| | 13.1.4. කිරිදි ඔය | ජලාශ වල වර්තමාන ජල ධාරිතාවයන් | ලුණුගම්වෙහෙර ජලාශයේ ජල ධාරිතාවය අක්කර අඩි 149,685කි. තිස්සවැව අක්කර අඩි 3,400කි. යෝධවැව අක්කර අඩි 7800කි, බඳගිරිය වැව අක්කර අඩි 7750කි. විරවිලවැව අක්කර අඩි 10850 හා දෙබරවැව අක්කර අඩි 600 ලෙස පවතින බව දැනුම් දෙන ලදී. වෙහෙරගල ජලාශයේ වර්තමාන ජල ධාරිතාවය අක්කර අඩි 47111කි. ප්‍රතිශතයක් ලෙස 90% පමණ ජලය පවතින බවත් කන්නය සම්බන්දයෙන් ගැටලුවක් නොවන බවත් දැනුම් දෙන ලදී. මේ කන්නය අවසන් වන විට අක්කර අඩි ලක්ෂයක් ජලය ඉතුරු කර ගැනීමට හැකි වනු ඇති බවත්, ඉදිරි අතරමැදි කන්නයේ මුං වගාව සඳහා කටයුතු සූදානම් කරමින් පවතින බවත් දැනුම් දෙන ලදී. අමතර ජල මුර ලබා දීම සාර්ථකව කළමණාකරනය කර ඇති බව දැනුම් දෙන ලදී. ඉදිකිරීම කටයුතු කන්නය තුල දීම සිදු කරන බැවින් අගෝස්තු වන විට අවසන් කළ හැකි බව දැනුම් දෙන ලදී. මුං ඇටද අතුරු කන්නය සඳහා වන බීජ ලබා ගැනීමට වගාවන් සිදු කර ඇති බව ද දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු තිස්සමහාරාම ය |
| | 13.1.5 රිදියගම | | රිදියගම ජලාශය ධාරිතාවය අක්කර අඩි 21619කි.එනම් 80%කට වැඩි ප්‍රමාණයකි. 80%ක් පමණ වගා කටයුතු අවසන් කර ඇත. රිදියගම ජලාශයේ පෝෂිත ඇළ පටන් ගන්නා ස්ථානයේ පැරණි පාලමක් සාදා ඇති අතර විශාල වශයෙන් ඇළ මාර්ගයේ ඉවුරු ඛාදනය සිදු වී ඇත. මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය අවස්ථා කිහිපයකදි දැනුවත් කර ඇති බවත් සඳහන් කරන ලදී.<br><br>කොග්ගළආර බස්නාව හා කඩවරවැව වාන් දැමීම නිසා වගා කටයුතු සිදු කිරිමට ප්‍රමාද වු බවත්, මේ වනවිට අස්වනු නෙලා අවසන් කර ඇති බවත් දැනුම් දෙන ලදී. මාස 3 ½ වී නැවත වගා කළහොත් නැවතත් ගැටළුවක් ඇති වන බවද සඳහන් කරන ලදී. මාස 2 ½ හෝ මාස 3 වී වගා කිරිම මගින් එම ගැටළුව විසඳා ගත හැකි බවද දැනුම් දෙන ලදී.<br><br>බැරගමවිලේ ලුනුබෝක්කුව ආසන්නයේ ඇති සීපී[illegible]46 ජල නළයේ මධ්‍යස්ථ කොටස කැඩියාමකට ලක් වී ඇති බවත්, ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා පාරේ යොදා ඇති කාපට් ඉවත් කළ යුතු බවත්, මේ සම්බන්ධයෙන් හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් හා පි.ආර්.ඩී ඉංජිනේරු සමඟ සාකච්ඡා කළ බවද දැනුම් දෙන ලදී. 2024.05.01 | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, හම්බන්තොට.<br><br>ප්‍රාදේශීය වාරිමාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | | | දින එම ජල නළයට අදාළ මාර්ග කොටස කඩා, ජල නළය ප්‍රතිසංස්කරණය කිරීමට අදහස් කරන බවත් දැනුම් දෙන ලදි. පී.ආර්.ඩී. හා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු තීරණයක් මඟින් එම පාරට නැවත කාපට් අසුරා දෙන මෙන් ඉල්ලීමක් ඉදිරිපත් විය.<br><br>කුඩා බෝලාන කරගස්ආර ප්‍රෙද්ශයේ පාලම සැදීමේ වැඩ කටයුතු 90%ක් පමණ අවසන් කර ඇති බව දැනුම් දෙන ලදි.<br><br>රිදියගම ප්‍රධාන ඇළ මාර්ගයට විශාල ගසක් කඩා වැටී ඇති බවත්, මේ සම්බන්ධයෙන් මේ වනවිට අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් හා දැව සංස්ථාව දැනුවත් කර ඇති බවත් සඳහන් කරන ලදි. කඩිනමින් එම කඩා වැටී ඇති ගස ඉවත් කර දීමට කටයුතු කරන මෙන් දැව සංස්ථාවේ දිස්ත්‍රික් කළමණාකරු වෙත දැනුම් දෙන ලදි. | ඉංජිනේරු, හම්බන්තොට. |
| | 13.1.6. ලියන්ගස්තොට | ප්‍රගතිය | ලියන්ගස්තොට අමුණ මේ වනවිට අඩි පහයි අඟල් තුනක් වාන් මට්ටමේ පවතින බවත්, 2024 යල කන්නය සඳහා ලියන්ගස්තොට දකුනු ඉවුරේ වගා කටයුතු 80%ක් වපුරා අවසන් කර ඇති බව දැනුම් දෙන ලදි. | |
| | 13.1.7. මව්ආර ව්‍යාපාරය | ප්‍රගතිය | මවුආර ජලාශයේ ජල ධාරිතාව අක්කර අඩි 27599කි. මව්ආර ජලාශයෙන් පෝෂණය වන පහළ වැව් පද්ධතියේද 90%කට වඩා වැඩි ජල ප්‍රමාණයක් පවතින බවද සඳහන් කරන ලදි. 2024 යල කන්නය සාර්ථකව අවසන් කර ගැනීමට ප්‍රමාණවත් තරම් ජලය පවතින බවද සඳහන් කරන ලදි. 95%ක් පමණ මේ වනවිට වපුරා අවසන් කර ඇති බව දැනුම් දෙන ලදි. | |
| 14. | වාරි කළමණාකරණ අංශ | කිරිඳි ඔය කළාපය | පසුගිය මහ කන්නයේ බඳගිරිය ව්‍යාපාරයේ ජල ගැලීම් හේතුවෙන් කුඹුරු අක්කර 30ක පමණ ප්‍රමාද වී වගා කටයුතු සිදු කළ අතර මේ දිනවල අස්වනු නෙලීමේ කටයුතු සිදු කරමින් පවතින බව සඳහන් කරන ලදි. එම අක්කර 30 සඳහා මුං වගා කිරීමට යෝජනා වුවත් කන්න රැස්වීමේ දි මේ සම්බන්ධයෙන් තිරණයක් ගෙන නොමැති බැවින්, මුං වගා කිරීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුවේ අනුමැතිය ලබා දෙන ලෙස ඉල්ලීමක් ඉදිරිපත් වු අතර ඒ සඳහා අනුමැතිය ලබා දෙන ලදි. | ව්‍යාපෘති කළමණාකරු, කිරිදිඔය ව්‍යාපාර |
| | | මුරුතවෙල කලාපය | විශේෂ ගැටළු කිසිවක් වාර්තා නොවිය. | ව්‍යාපෘති කළමණාකරු, මුරුතවෙල ව්‍යාපාරය. |
| | | රිදියගම කලාප | කෙසෙල් වගාවන් හේතුවෙන් වී වගා ගොවින් දැඩි අසිරුතාවයකට පත්වන බව දැනුම් දෙන ලදි.<br>කන්න රැස්වීම් තිරණ වලට පටහැනිව මුං වගා කිරීමට ගොවින් දිරිමත් කිරිම අනෙකුත් ආයතන මඟින් සිදු නොකළ යුතුබව දැනුම් දෙන ලදි. | ව්‍යාපෘති කළමණාකරු, රිදියගම. |
| 15. | සුළු වාරිමාර්ග 15.1 පළාත් වාරි මාර්ග | | විශේෂ ගැටලු කිසිවක් වාර්තා නොවිය. | දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු |

| | | | | |
|---|---|---|---|---|
| | 15.2. ගොවිජන සේවා දෙපාර්තමේන්තුව | | 2024 යල කන්නය සඳහා මුල්‍යා සහනාධාර වැඩසටහන යටතේ ගොවින්ගේ දත්ත ඇතුළත් කිරීම සඳහා ගොවිජන සේවා මට්ටමින් කාර්යයන් සිදු කරමින් පවතින බවත්, දැනට හෙක්ටයාර 4000ක පමණ සංඛ්‍යාවක තොරතුරු ඇතුළත් කර ඇති බවත් සඳහන් කරන ලදි.තිරසාර ගෙවතු වැඩසටහන යටතේ ගෙවතු 10000ක් සඳහා ඉලක්ක වැඩසටහනක් ලබා දී ඇති බවත්, ඒ සඳහා ගොවින්ගේ නාම ලේඛන සකස් කරමින් පවතින බවත් සඳහන් කරන ලදි. මෙහි සමාරම්භක උත්සවය අඟුනුකොළපැලැස්සේ දී ගරු කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පැවැත්වූ බවද සඳහන් කරන ලදි.පර්චස් 10ට වැඩි භූමියක එක් බෝගයක් පමණක් ව්‍යාප්ත කර වාණිජ වගාවක් ලෙස පවත්වා ගෙනයාම මෙහි අරමුණ බව සඳහන් කරන ලදි. මේ සඳහා ගොවින්ගේ නාමලේඛන මේ වනවිට ලබා ගනිමින් පවතින බවද සඳහන් කරන ලදි. මීට අමතරව ගිය ගොවියා වැඩසටහන යටතේ කෘෂි නාමලේඛනය යාවත්කාලින කිරීම ඩිජිටල් ක්‍රමයට (Digital) සිදු කරමින් පවතින බවත් සඳහන් කරන ලදි.<br>සංවර්ධන වැඩසටහන් යටතේ වැඩසටහන් 120ක ඇස්තමේන්තු සකස් කර, ඉන් කිහිපයක් අනුමැතිය සඳහා ප්‍රධාන කාර්යාලය වෙත යොමු කර ඇති බව සඳහන් කරන ලදි. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් |
| 16. | වී අලෙවි මණ්ඩලය | ප්‍රගතිය | විශේෂ ගැටලු කිසිවක් වාර්තා නොවීය. | ප්‍රාදේශීය කළමනාකරු, වී අලෙවි මණ්ඩලය. |
| 17. | අපනයන කෘෂි බෝග වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | අපනයන කෘෂි බෝග නව වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉල්ලුම්පත් 34ක් ලැබී ඇති අතර මූලික ඉඩම් පරීක්ෂණ 23ක් සිදුකර ඇත. කුඩා පරිමාණ හා ගෙවතු වගා ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉල්ලුම්පත් 15ක් ලැබී ඇති අතර මූලික ඉඩම් පරීක්ෂන 15ක් සිදු කර ඇත. පුවක් ප්‍රවර්ධන වැඩසටහන යටතේ ඉල්ලුම්පත් 6ක් ලැබී ඇත. ගොවි පුහුනු වැඩසටහන් 24ක් සිදු කර ගොවීන් 569 දෙනෙක් පුහුනු කිරීම සිදු කර ඇත. බටඅත කෘෂි තාක්ෂණ උද්‍යානයේ දී ආහාර හා කෘෂිකර්ම සංවිධානයේ ආසියා පැසිපික් සමුළුවට සමගාමීව කෘෂිතාක්ෂණික ප්‍රදර්ශනය පැවැත්වීම රත්නපුර දිස්ත්‍රික්කයේ වැනිලා වගාව පිළිබඳව පැවති ක්ෂේත්‍ර පුහුණු වැඩසටහන සඳහා සහභාගී වීම. | සහකාර අධ්‍යක්ෂ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව |
| 18. | පොල් වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම<br><br>තැඹිලි ගම්මාන පිහිටුවීම | සහනාධාර යටතේ නව/ නැවත/ යටි වගාව මගින් ක්‍රමවත් පොල් වගාව ස්ථාපිත කිරීම(පැළ) ඉලක්කය 30000කි. ප්‍රගතිය 3289කි. සහනාධාර යටතේ ගෙවතු වගා මගින් පොල් වගාව ස්ථාපිත කිරීම (පැළ) ඉලක්කය 1000කි. ප්‍රගතිය පැළ 230කි. තරුණ කෘෂි ව්‍යවසායකත්ව වැඩ සටහන සඳහා පොල්පැළ නොමිලේ ලබාදීම පැළ 11110කි. කප්රුක ආයෝජන ණය යෝජනා ක්‍රමය ඉලක්කය අක්කර 200කි. ප්‍රගතිය අක්කර 78කි. පාළු පැළ සිටුවීම ඉලක්කය පැළ 3000කි. ප්‍රගතිය පැළ 175කි. ව්‍යාප්ති වැඩසටහන් ප්‍රගතිය 10කි. පුහුනු මධ්‍යස්ථාන මගින් දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්කය 41කි. ප්‍රගතිය 05කි. පොල් සංවර්ධන නිලධාරී විසින් සිදු කරන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් ඉලක්කය 37කි. ප්‍රගතිය 12කි. මයිටා පැකට් බෙදා දීම ඉලක්කය පැකට් 14325කි. ප්‍රගතිය 686කි. විශේෂ තැඹිලි වගා ව්‍යාපෘතිය ප්‍රගතිය 1712කි. හම්බන්තොට දිස්ත්‍රික්කය තුල සුදු මැස්සන් හානිය ව්‍යාප්තවෙමින් පවතින අතර මේ වනවිට ගස් 42776ක හානිය හදුනාගෙන ඇති අතර පොල් වගා කිරීමේ මණ්ඩලය මගින් ගස් 13218ක් සඳහා ප්‍රතිකාර කර ඇත. මීට අමතරව 2023 වර්ෂයේ අවසන් මාස කිහිපය තුල හම්බන්තොට දිස්ත්‍රික්කය තුල බොන්ටිස්පා හානි වූ | දිස්ත්‍රික් නිලධාරී පොල් සංවර්ධන මණ්ඩලය |

| | | | | |
|---|---|---|---|---|
| | | | ගස් 659ක් හදුනාගත් අතර එම ගස් 659ටම මොනක්‍රොටපොස් පොල් වගාකිරීමේ මණ්ඩලය මගින් නිකුත් කෙට ඇත. දිස්ත්‍රික්කය තුල මේ වනවිට බ්‍රොන්ටිස්පා හානිය සළකුණු කළ ගස් 659ක් වන අතර මොනක්‍රොටපොස් එන්නත් කළ ගස් ගණන 659ක් වේ. තැඹිලි ගම්මාන පිහිටුවීමේ ව්‍යාපෘතිය යටතේ හම්බන්තොට දිස්ත්‍රික්යේ විශේෂ ගම්මාන 3ක් (මුරුතවෙල රළුව, දහඅමුණ) පිහිටුවා ඇත. පැළ 2500ක් බෙදා දී ඇත. | |
| 19. | කජු වගාව | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | හම්බන්තොට කජු සංවර්ධන බල ප්‍රදේශයේ 2023 වර්ෂයේ සහනාධාර බද්ධ කජු පැළ 6440ක් ගොවින් වෙත බෙදා දී ඇත.(අඟුණුකොළපැලැස්ස බද්ද පැළ 2765ක් හා සූරියවැව බල ප්‍රදේශයේ බද්ධ පැළ 3675ක්) හම්බන්තොට දිස්ත්‍රික් 2024 ව්‍යාප්ති වැඩසටහන සඳහා පහත සඳහන් පරිදි බද්ධ කජු පැළ 12500ක් හා බීජ කජු පැළ 400ක් ලබා දීමට සැළසුම් කර ඇත. ( බද්ධ කජු පැළ ලබා දීම ගරු කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍ය මහින්ද අමරවීර මැතිතුමාගේ හම්බන්තොට දිස්ත්‍රික් තරුණ කෘෂි ව්‍යාවසායකත්ව වැඩසටහන සඳහා ඒකාබද්ධව ක්‍රියාත්මක කිරීමට සැළසුම් කර ඇත. අම්බලන්තොට පැළ 1800කි. හම්බන්තොට පැළ 1000කි ලුණුගම්වෙහෙර පැළ 400කි. තිස්ස පැළ 1000කි. සූරියවැව පැළ 1100කි. අඟුණුකොළපැලැස්ස පැළ 1800කි. තංගල්ල පැළ 1800කි. බෙලිඅත්ත පැළ 500කි. ඕකෙවෙල පැළ 500කි. කටුවන පැළ 1000කි. වීරකැටිය පැළ 800කි. වලස්මුල්ල පැළ 1800කි. | සහකාර ප්‍රාදේශීය කළමනාකරු, ශ්‍රී ලංකා කජු සංස්ථාව |
| 20. | රබර් වගාව | ප්‍රගතිය | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා සම්බන්ධවී නොමැත. | |
| 21. | සත්ත්ව පාලනය හා තෘණ භූමි | ප්‍රගතිය | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා සම්බන්ධවී නොමැත. | |
| 22. | කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය | | විශේෂ ගැටළු කිසිවක් වාර්තා නොවිය. | සහකාර අධ්‍යක්ෂ කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය |
| 23. | ශ්‍රී ලංකා හදබිම සංවර්ධන අධිකාරිය | ප්‍රගතිය | ප්‍රගතිය ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් නිලධාරී ශ්‍රී ලංකා හදබිම අධිකාරිය |
| 24. | පසු අස්වනු තාක්ෂණ ආයතනය | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා සම්බන්ධවී නොමැත. | |
| 25. | වියලි කලාපීය උද්භිත උද්‍යානයේ වැඩ සටහන් | ප්‍රගතිය ඉදිරිපත් තිරීස | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා සම්බන්ධවී නොමැත. | සහකාර අධ්‍යක්ෂ |
| 26. | තල් සංවර්ධන මණ්ඩලය | ප්‍රගතිය | විශේෂ ගැටලු කිසිවක් වාර්තා නොවීය. | දිස්ත්‍රික් නිලධාරී තල් සංවර්ධන මණ්ඩලය (වීරවිල) |
| 27. | ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (වීරවිල/ රිදියගම) | වීරවිල ගොවිපල<br>රිදියගම ගොවිපල | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත.<br>දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | ගොවිපල කළමණාකරු ( වීරවිල) ගොවිපල කළමණාකරු ( රිදියගම) |
| 28. | 28.1 ධීවර කටයුතු ශ්‍රී ලංකා ජල ජීවී වගා සංවර්ධන | නිත්‍ය/ කාලීන ජලාශ/පොකුණු තුල මත්ස්‍ය | විශාල ජලාශ 2ක් තුල මත්ස්‍ය ඇඟිල්ලන් ඉලක්කය 1984100කි.ප්‍රගතිය මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 160000කි. ප්‍රතිශතය 8.06%කි. මධ්‍ය ජලාශ 6ක් තුල මත්ස්‍ය ඇඟිල්ලන් ඉලක්කය 2543000කි. ප්‍රගතිය මත්ස්‍ය | දිස්ත්‍රික් නිලධාරී, ශ්‍රීලංකා ජලජීවී |

| | | | | |
|---|---|---|---|---|
| | අධිකාරිය (මිරිදිය ධීවර කටයුතු) | ඇඟිල්ලන් තැන්පත් කිරීම<br><br>මිරිදිය ඉස්සන් තැන්පත් කිරීම<br><br>මත්ස්‍ය අස්වැන්න<br><br>ධීවර කළමණාකරණ දත්ත<br><br>මත්ස්‍ය මිල ගණන්<br><br>ජලාශයන් හිස්ථාපිත දැල් කූඩු තුල ඇසිත්තන් තැන්පත් කිරීම | ඇඟිල්ලන් සංඛ්‍යාව 132,125කි. ප්‍රතිශතය 5.19%කි. කුඩා ජලාශ 65කි. ඉලක්කය 5,342,250කි. ප්‍රගතිය මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 746750කි. ප්‍රතිශතය 13.97%කි. කාලීන ජලාශ 332කි. ඉලක්කය 170,920කි. තැන්පත් කරන ලද මත්ස්‍ය ඇඟිල්ලන් සංඛ්‍යාව 130,650කි.ප්‍රතිශතය 76.43%කි.<br><br>විශාල ජලාශ 2ක් තුල 1,792,000කි. ප්‍රගතිය 348,473කි. ප්‍රතිශතය 19.44%කි. කුඩා ජලාශ 65ක් තුල ඉස්සන් ඉලක්කය 2,205,000කි, ප්‍රගතිය 100,000කි. ප්‍රතිශතය 4.53%කි. මධ්‍යම ජලාශ 6ක් තුල 11,167,000කි. ප්‍රගතිය මිරිදිය ඉස්සන් 335,307කි. ප්‍රතිශතය 28.73%කි.<br>2024 පෙබරවාරි 29 දක්වා නිත්‍ය කාලීන ජලශ පොකුණු /ගංගා තුල සමුච්චිත ප්‍රගතිය මෙටො.543කි.<br><br>මෙහෙයුම් කළමනාකරණ බලපත්‍ර ලබා දීම 110කි. ජලජීවී වගා කළමණාකරණ බලපත්‍ර ලබා දීම් 12කි. යාත්‍රා ලියාපදිංචි කිරීම 178කි. වැටලීම් කටයුතු 07 කි.<br><br>තිලාපියා කිලෝවක තොග මිල රු.450.00-500.00කි. සිල්ලර 700.00- 750.00කි. කාපයා තොග මිල කිලෝවක් 350.00-450.00කි. සිල්ලර රු.700.00-750.00කි. මිරිදය ඉස්සන් තොග මිල කිලෝවක් රු.1800.00-2000.00කි. සිල්ලර මිල රු.2500.00 සිට 2700.00 දක්වා වේ.<br><br>ජලාශයන් 2ක දැල් කූඩු 4ක ඇසිත්තන් 205,000ක් තැන්පත් කරන ලදී. | සංවර්ධන අධිකාරිය |
| | | | කෘෂිකර්ම නවීකරණ වැඩසටහන යටතේ නව තාක්ෂණය සහිත විසිතුරු මත්ස්‍ය වගාව සම්බන්ධයෙන් වැඩසටහන ක්‍රියාත්මක කිරීමට උපදෙස් ලබා දී ඇති බවත්, රුපියල් ලක්ෂ 05ක උපරිමයකට යටත්ව ණය පහසුකම් ලබා දෙන ලෙසත්, ඒ සඳහා සුදුසු ප්‍රතිලාභීන් තෝරා ගැනීම් සිදු කරන ලෙසත් දැනුවත් කර ඇති බව සඳහන් කරන ලදි. මිලියන 35ක මුදලක් මේ සඳහා වෙන් වී ඇත. අඟුණුකොළපැලැස්ස හා සූරියවැව කොට්ඨාස 02ක තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට නියමිත බවත් සඳහන් කරන ලදි. ලබාදෙන ණය මුදල, මාස 24ක් තුළ නැවත ගෙවීම සිදු කළ යුතුය. 30% ක හා 50%ක ප්‍රතිලාභී දායකත්වයක් අදාළ ප්‍රතිලාභියා විසින් දැරිය යුතුය. අදාළ ණය මුදල ගෙවීමට පොලී රහිත මාස 02ක සහන කාලයක් ලබා දෙන ලෙස උපදෙස් ලැබී ඇති බවත් සඳහන් කරන ලදි. විසිතුරු මත්ස්‍ය වගාකරුවන් සඳහා මෙම අවස්ථාව හිමි වන බවද සඳහන් කරන ලදි. | දිස්ත්‍රික් නිලධාරී, ශ්‍රීලංකා ජලජීවී සංවර්ධන අධිකාරිය |
| | 28.2. කරදිය ධීවර කටයුතු | ප්‍රගතිය ඉදිරිපත් කිරීම | විශේෂ ගැටලු කිසිවක් වාර්තා නොවීය. | සහකාර අධ්‍යක්ෂ ධීවර දෙපාර්තමේන්තුව |
| 29. | වනජීවී කටයුතු | | තිස්සමහාරාම කලාපයේ වන අලින් ගම් වැදීම බහුල ලෙස සිදුවන බැවින් මෙම තත්ත්වය වැළැක්වීම සඳහා වනජීවී දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ චාරිකා සිදු කිරීම වැදගත් වන බව ගොවි නියෝජිතයින් විසින් දැනුම් දෙන ලදී.<br><br>වන අලි ඉවත් කිරීම සඳහා විදුලි වැට අසාර්ථක බවත් මේ සඳහා වෙනත් උපක්‍රමයක් හෝ ක්‍රමවේදයක් යොදා ගත යුතු බවත්, මේ සම්බන්දයෙන් වනජීවී දෙපාර්තමේන්තුව මැදිහත්වීම සිදු කළ යුතු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී.<br>වන අලින් ගම්වැදීම වැළැක්වීම සඳහා අලි අගල් කැපීම සුදුසු බවත් මෙම ක්‍රමවේදය ඌව කලාපයේ සාර්ථකව ක්‍රියාත්මක බව වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන් විසින් දැනුම් දෙන ලදී.<br>විදුලිවැට වුවද වෝල්ට් 10ක් හෝ 11ක් පවත්වා ගන්නේ | සහාකාර අධ්‍යක්ෂ වන ජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව<br><br>සහකාර අධ්‍යක්ෂ වන ජීවී සංවර්ධන දෙපාර්තමේන්තුව (ඌව කළාපය) |

| | | | | |
|---|---|---|---|---|
| | | | නම් වැට කැඩීම අඩු වන බව සඳහන් කරන ලදී.<br>දිස්ත්‍රික්කය තුල පවතින ඉදිකර අවසන් නොවූ විදුලි වැට සම්පූර්ණය කර මාර්ග හරහා ස්ප්‍රිං ගේට්ටු දැමීම මගින් හා කිලෝමීටර් 40ක් පමණ විදුලි වැට සැකසීමෙන් මෙම ගැටලු විසදා ගැනීම සිදු කළ හැකි බවත් මේ සඳහා අවශ මුදල් ප්‍රතිපාදන පවතින බවත් දැනුම් දෙන ලදී.<br>මෙම ගැටලු විසදීම සඳහා අදාළ නිලදාරින් හා ගොවි නියොජිතයින් එක්ව සාකච්ජාවක් සිදු කළ යුතු බව තීරණය කර ගත යුතු බව තීරණය විය.<br>වල්සපුගල පවතින විදුලි වැට ද අදාළ තාක්ෂණික නිලධාරීන් යොදවා සැකසීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී.<br>මෙම ගැටලු සම්බන්ධයෙන් වනජීවී අධ්‍යක්ෂ ජනරාල් වරයා වෙත ලිපියක් සැකසීම සුදුසු බව දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | |
| 30. | වන සංරක්ෂණ කටයුතු | | දේශගුණ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය යටතේ සිදු කෙරෙන වනරක්ෂිත තුල වැව් ප්‍රතිසංස්කරණය කිරිමේදි ඉවත් කරනු ශාක වෙනුවට නැවත අළුතින් ශාක සිටුවිමට අදාළ කටයුතු සිදු කරන මෙන් සඳහන් කරන ලදි. මේ වන විටත් එම කටයුතු ආරම්භ කර ඇති අතර ඉදිරි වර්ෂාකාලයත් සමඟ ඉතිරි පැළ සිටුවීමට හැකි වැව් වලද අදාළ කටයුතු සිදුකරන බව දැනුම් දෙන ලදී.<br>මෙම වර්ෂයේ රුක් රෝපණ ව්‍යාපෘති සඳහා විවිධ ආයතන වෙත පැළ අවශ්‍ය වේනම් ඉල්ලීම් සිදුකරන ලෙස දැනුම් දෙන ලදී. | දිසා වන නිලධාරී හම්බන්තොට |
| 31. | රාජ්‍ය දැව සංස්ථාව | | ඌරුබොකු ඔය ව්‍යාපාරයේ ඇළමාර්ග වෙත වැටී ඇති ගස් ඉවත් කිරීමට මැයි මස 01 වන දින තංගල්ල ප්‍රදේශයට අවශ්‍ය යන්ත්‍ර යොමු කිරීමට කටයුතු කරන බව දැනුම් දෙන ලදී. කිරිදි ඔය ව්‍යාපාරයේ කිරිදි ඔය වෙත වැටී ඇති ගස් ඉවත් කිරීමට කටයුතු කළ බව දැව සංස්ථාවේ දිස්ත්‍රික් කළමණාකරු විසින් දැනුම් දෙන ලදී,<br>එම ඉවත් කරන ලද ගස් වල අතු ඇලමාර්ග තුල පවතින බැවින් එම කොටස් ඇනිකට් තුල රැඳීමෙන් ගැටලු ඇතිවන බවත් එම අතුද ඉවත් කිරීමට කටයුතු කරන ලෙසත් ගොවි නියෝජිතයින් විසින් ඉල්ලීම් කරන ලදී.<br>කැළෑ ගිනි ඇතිවිම වැලැක්විමට කටයුතු සිදු කරන මෙන් යෝජනා විය. | දිස්ත්‍රික් කළමණාකරු රාජ්‍ය දැව සංස්ථාව |
| 32. | ඉඩම්කටයුතු<br>32.1 ඉඩම් බලපත්‍ර නිකුත් කිරීම හා ඉඩම් කටයුතු (පළාත්) | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| | 32.2 ඉඩම් දීමනා පත්‍ර බලපත්‍ර නිකුත් කිරීම, ඉඩම් කටයුතු (අපවා) | | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | |
| | 32.3 ඉඩම් පරිහරණ සැලසුම් | | ඉඩම් පරිහරණ දත්ත එකතු කිරීම යාවත්කාලීන කිරීම දත්ත හුවමාරුව සහ ඉඩම් පරිහරණ සැළසුම්කරණය ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය හා භූමි පරිහරණ වෙනස්කම් හඳුනාගැනීමේ සමීක්ෂණය සිදු කෙරෙන ඉලක්ක ගත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 12කි. ජාතික ඉඩම් පරිහරණ සමීක්ෂණය යටතේ දත්ත පද්ධතිය සකසා ප්‍රධාන කාර්යාලය වෙත භාරදී ඇත. භූමි පරිහරණ වෙනස්කම් හදුනාගැනීමේ සමීක්ෂණය සඳහා මූලික දැනුවත් කිරීමේ වැඩසටහන පවත්වන ලදී. මේ මස ප්‍රගතිය 5%කි. පස හා ජල සංරක්ෂණය තුලින් ඌණ පරිහරණ කෘෂිකාර්මික බිම්වල ඵලදායිතාවය ඉහල නැන්වීමේ ඉලක්කය බෙලිඅත්ත ගැටමාන්න දකුණ, කටුවන මැදකන්ද හා වලස්මුල්ල කැබැල්ලකැටිය වේ. | සහකාර අධ්‍යක්ෂ (ඉඩම් පරිහරණ සැලසුම්) |

| | | | | |
|---|---|---|---|---|
| | | | මේ මස ප්‍රගතිය 17%කි. ග්‍රාමීය සහ ක්ෂුද්‍ර ජල පෝෂක සඳහා ඉඩම් පරිහරණ සැලසුමේ සකස් කිරීම යටතේ හම්බන්තොට, එලල්ල, ඕකෙවෙල කණුමුල්දෙනිය දකුණ, තංගල්ල පට්ටියපොළ දකුණ, තිස්සමහාරාමය-බබැබඹ එල්ලංගා පද්ධතිය හා වීරකැටිය රළුව සීතාවක දෙණිය එල්ලංගා පද්ධතිය මේ මස දක්වා ප්‍රගතිය 16%කි. සුවිශේෂී ඉඩම් පරිහරණ ගැටළු පාදක කර ගනිමින් සිදුකරණු ලබන විශේෂ අධ්‍යන සූරියවැව දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව නිසා සිදුව ඇති ඉඩම් පරිහරණ වෙනස්කම් සහ සමාජ ආර්ථක බලපෑම අධ්‍යනය කිරීම මේ මස ප්‍රගතිය 3%කි. විද්‍යාත්මක ඉඩම් පරිහරණ සැළසුම් කරණය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම (අම්බලන්තොට, වීරකැටිය) මේ මස ප්‍රගතිය 45%කි. දිස්ත්‍රික් ඉඩම් පරිහරණ කමිටු පැවැත්වීම ඉලක්කය 4කි. ප්‍රගතිය 25%කි. ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැළැසුම් කමිටු පැවැත්වීම ඉලක්කය 17කි. මේ මස ප්‍රගතිය 47කි. (අම්බලන්තොට, ලුණුගම්වෙහෙර,සූරියවැව, තංගල්ල, වීරකැටිය) | |
| 33. | ජාතික තරුණ සේවා සභාවේ කටයුතු | ප්‍රගතිය | දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටුව සඳහා නිලධාරීන් සම්බන්ධවී නොමැත. | දිස්ත්‍රික් නිලධාරී, ජාතික තරුණ සේවා සභාව, එරම්ණියාය. |
| 34. | මධ්‍යම පරිසර අධිකාරිය | | විශේෂ ගැටළු කිසිවක් වාර්තා නොවීය | දිස්ත්‍රික් පරිසර නිළදාරී |
| 35. | වෙනත් ගැටළු හා යෝජනා | අරන්වල අඟුල්මඩුව පාලම | අරන්වල අඟුල්මඩුව පාලම ආසන්නයේ පවතින යකඩ කණු අක්කර 15ක පමණ කුඹුරු යායක් විනාශ වන පරිදි දමා තිබීම හේතුවෙන් ගොවීන් දැඩි දුෂ්කරතායකට පත් වී ඇති බවත් මේ සම්බන්ධව කරන ලද දැනුම් දීම වලදී අදාළ නිළධාරීන් විසින් ස්ථානය පරීක්ෂා කළ අතර මේ වන වනතෙක් වැඩ කටයුතු ආරම්භ වී නොමැති බැවින් මෙම යල කන්නයේ ද වගාවන් හානිවීමට සිදුවිය හැකි බවත් මෙම කටයුතු කඩිනම් කරන ලෙස නැවත මාර්ග සංවර්ධන නිළධාරීන් වෙත දැනුම් දීමට තීරණය විය. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ/ ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු, වීරකැටිය. |
| | | පොහොර සමාගම් මගින් ගොජවින සේවා මධ්‍යස්ථාන වෙත ලබා දෙන පොහොර සඳහා වට්ටම් ලබා නොදීම | පෞද්ගලික පොහොර සමාගම් මගින් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත පොහොර ලබා දීමේ දී ගොවිජන සේවා මධ්‍යස්ථන මගින් කරනු ලබන මෙහෙයුම් කටයුතු සඳහා වන මුදල් ලබා ගැනීමට වට්ටමක් හෝ ලබා දීම සිදු නොවන බැවින් කටයුතු කරගෙන යාමේ ගැටලුවක් ඇති බවත්, මේ සඳහා ලබා දෙන පොහොර වෙනුවෙන් ගොවිජන සේවා මධ්‍යස්ථන වෙත පරිහරණ වියදම් වෙනුවෙන් වට්ටමක් ලබා දිමට කටයුතු කරන ලෙස ගොවි නියෝජිතයින් හා ගොවිජන සේවා දෙපාර්තමේන්තුව කරුණු ඉදිරිපත් කළ අතර ඒ සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම් දැනුවත් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙස දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ |
| | | වීරවිල ගොවිජන සේවා අලෙවි සැළ | වීරවිලගොවිජන සේවා මධ්‍යස්ථානයේ සුහුරු වාරි කෘෂිකාර්මික ව්‍යාපෘතිය මගින් ඉදිකරන ලද අලෙවි සැලේ දොර සකසා දෙන ලෙස ගොවි නියෝජිතයින් විසින් ඉල්ලීම් කරන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, දේශගුණික සුහුරු වැඩසටහන |
| | | බිත්තර වී නිෂ්පාදනය | හදිසි අවශ්‍යතායකදී භාවිතයට ගැනිමට මාස 2 ½ හා මාස 3 බිත්තර වී, රජයේ බිත්තර වී නිෂ්පාදනය කරන ගොවිපලවල් තුළ නිෂ්පාදනය කිරීමට කටයුතු කිරීම සුදුසු බව යෝජනා විය. | දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ |
| | | බැබිලදෙණිය අමුණ | බෙලිඅත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බැබිලදෙණිය අමුණ ප්‍රතිසංස්කරණය කර දෙන ලෙස | පළාත් වාරිමාර්ග |

| | | | | |
|---|---|---|---|---|
| | | ප්‍රතිසංස්කරණය | ඉල්ලීමක් ඉදිරිපත් විය. මේ සම්බන්ධයෙන් සොයා බලන ලෙස පළාත් වාරිමාර්ග ඉංජිනේරු වෙත දිස්ත්‍රික් ලේකම් විසින් දැනුම් දෙන ලදී. | ඉංජිනේරු |
| | | උරුමය ජාතික වැඩසටහන | උරුමය ජාතික වැඩසටහන, රජයේ ප්‍රතිපත්තිමය වැඩසටහනක් ලෙස මේ වනවිට ක්‍රියාත්මක වන අතර ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ බලපත්‍ර හා දීමනාපත්‍ර ලබා දුන් ඔප්පු සහ බලපත්‍ර වලට සින්නක්කර ඔප්පුවක් ලබා දීමේ වැඩපිළිවෙලකි. බලපත්‍ර හා දීමනාපත්‍ර සහිත මේ වනවිට මිනුම් කටයුතු සිදු කර ඇති, නිරවුල්ව භුක්ති විදින ඉඩම් සඳහා සින්නක්කර ඔප්පුවක් ලබා ගැනීමේ හැකියාවක් පවතින බවත්, අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් එම කටයුතු සිදු කර ගත හැකි බව අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) විසින් දැනුම් දෙන ලදි | සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 36. | ලිපි ඉදිරිපත් කිරීම | _ඌරුබොකු ඔයට ගස් වැටීම | <u>රන්න ආශ්‍රිත ඌරුබොකු ඔයට ගස් වැටීම සම්බන්ධවයි</u><br>රාජ්‍ය දැව සංස්ථාවේ හම්බන්තොට ප්‍රාදේශීය කළමණාකරු විසින් හෙට දින (2024.05.01) මෙම ගස් ඉවත් කිරීම ආරම්භ කරන බව දැනුම් දෙන ලදී. | ප්‍රාදේශීය වාරිමාර්ග ඉංජිනේරු වීරකැටිය |
| | | ලොකු ළූණු වගාව | <u>2024 යල කන්නයේ ලොකු ළූණු වගාව සම්බන්ධවයි</u><br>මේ සම්බන්ධයෙන් දිසත්‍රික් කෘෂිකර්ම කමිටු සාමාජිකයින් දැනුවත් කරන ලදී. | |
| | | කොස් ගස් ඉවත් කිරීම | <u>ප්‍රවේශ මාර්ගය තුල පිහිටි කොස් ගස් හතරක් ඉවත් කිරීම සම්බන්ධවයි.</u><br>ජුලන්පිටිය, ගල්වාඩිය, අරුණි නිවස ලිපිනයේ පදිංචි රත්නායකගේ දයාරත්න විසින් ඉදිරිපත් කර ඇති ආවරණ අනුමැතියට යටත්ව කොස්ගස් කපා හෙළීමේ ඉල්ලීම සඳහා දිස්ත්‍රික් කෘෂිකර්ම කමිටු අනුමැතිය ලබා දෙන ලදී. | පරිපාලන නිලධාරී දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, හම්බන්තොට. |
| | | | <u>Call Nomination of Outstanding Farmers For Awarding</u><br>ගොවීන් නියොජිතයින් දැනුවත් කර ඇති අතර මීට අදාළ ගොවි මහත්වරුන්ගේ නාම ලේඛනයක් දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ කාර්යාලය වෙත ලබා දීමට කටයුතු කරන ලෙස දැනුම් දෙන ලදී. | ජානක ධර්ම කීර්ති ලේකම් කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය |
| | | මවුආර ව්‍යාපාර කන්න රැස්වීමේ දී සාකච්ජාවූ කරුණු | <u>2024.03.21 දින පවත්වන ලද මවුආර ව්‍යාපාර කන්න රැස්වීමේ දී සාකච්ජාවූ කරුණු සම්බන්ධවයි</u><br>පහල අන්දරවැව ගොවි සංවිධාන ගොවීන් 116ක් සඳහා කිරි සම්බා වගා කිරීමට අවශ්‍ය බිත්තර වී සපයා දෙන ලෙස කරන ලද ඉල්ලීමට ලබන කන්නයේ මෙම කටයුතු සඳහා බිත්තර වී ලබා දීමට හැකියාව පවතින බව දැනුම් දෙන ලදී. | නියෝජ්‍ය අධ්‍යක්ෂ, බීජ හා රෝපණ අංශය, බටඅත. |

ලේකම්

එස්. කේ. එස්. රුබසිංහ
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වැ/බ)සභාපති
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
හම්බන්තොට.

එස්.කේ.එස්.රුබසිංහ
දිස්ත්‍රික් කෘෂිකර්ම අධ්‍යක්ෂ (වැ/බ)
හම්බන්තොට.

හම්බන්තොට.

එච්.පී.සුමණසේකර
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.